# අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK

## 10 ශ්‍රේණිය     කාලය පැය 3 යි

## සිංහල සාහිත්‍යය හා රසාස්වාදය

සැලකිය යුතුයි : (1) කොටසේ ප්‍රශ්න දෙකටත් (11) කොටසේ ප්‍රශ්නයටත් (111) කොටසේ ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

### (1) කොටස

- ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.

  (1) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒ එක එකක් පිළිබඳව අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

1.

I. "දේවයන් වහන්ස මෙපමණකින්ම පණ්ඩිත නම් නොවෙත්මය. මේ ඉතා අල්ප දෙයක."
   අ) මේ ප්‍රකාශය කලේ කවුද ?
   ආ) "මේ ඉතා අල්ප දෙයක" යනුවෙන් හැඳින්වූයේ කුමක්ද ?

II. නැගෙනහිර යව මැදුම් ගම වසන පුරුෂයෝ නුවණැත්තෝය ; මේ කිහිරි දණ්ඩෙහි මේ අගයැ මේ මුලයැ යි දනිත්වයි . නොදනිත්නම් දහසක් දඩයැ
   අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්ද ?
   ආ) මේ කොටස අයත්වන අතුරු කතාව කුමක්ද ?

III. දරුවන් කෙරෙහි වැදුවන්ගේ ළය මොළොක්ද නොහොත් නොවැදුවන්ගේ ළය මොළොක්ද ?
   අ) මේ කාගේ ප්‍රකාශයක්ද ?
   ආ) මෙවැනි ප්‍රකාශයක් කිරීමට හේතුව කුමක්ද ?
   මනහර රුසිරු සර - දෙවියන් ලෙසින් සුරපුර
   උරයෙන් උර පැහැර - නිතර මහ සෙන් සිටිති එකවර
   අ) එනුවර මහ සේනාව උපමා කර ඇත්තේ කවුරුන්ටද ?
   ආ) මහා සේනාව බුදුගුණ අලංකාර කවියා වර්ණනා කර ඇත්තේ කෙසේද ?

IV. හිමයේ ගොසින් මල් යහනක සිටිනවද
   කොමළ අනඟි සිරිපා දෙක රිදෙනවද
   අ) මෙසේ අසන්නේ කවුරුන්ද ?
   ආ) මෙසේ ඇසීමට හේතුව කුමක්ද ?

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨවල ඉරි ඇඳි පදවල අර්ථය පළමුව වෙන් වෙන්ව ලියා ඒ එක් එක් කොටසෙහි සමස්ත අර්ථයද ලිහිල් බසින් ලියන්න.

I. ඒ තෙමේ පිට නමා වේදනාවෙන් වෙවුලමින් ගොස් රජ ගෙයි මහ බිතක්කනැ නිසා පිට පදනමැ වැදැ හොත්තේය.

II. ශරීරයෙන් ඔා බිඳ ගත්තේය. ශෝකයෙන් මඩනා ලද්දාහු චිත්තාස්වාදයක් නොලද්දාහ.

III. ගිජිඳුන් කිමද ගිලී       තුරඟුන් සමග නොහැකිලී
   නවාවන් රනැකිලී       කෙළින තැන් තැන්හි ගිලි අලිකුළී

IV. තෙමා වැටේ මගෙ සළු පිළි නෙත් පුරවා - අමා රසක් වන් හිමි සඳ සිහිවෙනවා
   උමා කුමරු වැඩියා මට සිහි වෙනවා - මෙමා ඇර ලියෝ ලෙව් තුල ඇත්ද තවා

V. මන්ද ඔතන හැංගී උඹ කරන්නේ - අන්දකාර සළු පොරවා වැනෙන්නේ
   නින්ද නැතුව මම පැදුරේ දපන්නේ - නින්ද සදාකාලික කොට දියන්නේ

## (11) කොටස

- අනිවාර්ය ප්‍රශ්නයකි

3. පහත සඳහන් කවි පංතිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මහ රජුනගෙ මෙන්ම - නිවට කැත යදියනගෙද
පහස ලබනා එකියකි - කාසිය යනු ඇගෙ ණම
කාසියක ඇත්තේ - මුහුණ එක නැතහොත් දෙක
එහෙත් අත් දහයෙකි - කකුල් කෝටියක් වැඩි
සුන්දර සුරපුරය - මෙන් රුදුරු අව පුරයද
කාසියක මැද්දෙන් - එකවර බැලිය හැකිවේ
මිනිසා විසින් ලොව - සොලවනු ලැබේ ඉදහිට
කාසිය නිසා හෙතෙම - නැවතුම් නැතුව සෙල්වේ
බල්ලකු නොකන මුත් - කාසිය නිසා මිනිසකු
බල්ලකු විම සඳහා - වැඩි කලක් නොයැවේ
කාසි සැදෙන්නේ - රනින් රිදියෙන් තඹයෙන්
කරදාසියෙන් හෝ නොව - දහදියෙනි මිනිසුන්ගේ

I. මෙහි වස්තු විෂයය කෙටියෙන් ලියන්න.
II. කවි පංතියේ රචකයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් ලියන්න.
III. "සුන්දර සුරපුරය - මෙන් රුදුරු අව පුරයද
කාසියක මැද්දෙන් - එකවර බැලිය හැකිවේ"
මෙහි ව්‍යංගාර්ථවත් අදහස ලියන්න.
IV. මෙම කවි පංතියට යොදාගෙනඇති භාෂාව පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

නැතහොත්,

අම්මාද දරුවා වඩාගත් ස්ත්‍රියද මමද සොල්දර තරප්පුවෙන් පහලට බැස්සෙමු. ඒ දෙදෙනා කතා කරමින් ආවෝය. මම ඇහුන්කම් දුනිමි'
අප්පෝ මේ ලොකු නිලදැහැරියන්ලෙන් නම් බේරෙන්න පුළුවන්. බැරි මේ ආරච්චිලා වගේ එවුන්ගෙන්. මිනිස්සු විඳින දුක් හිරිහැර පෙත්සමක් දී ගන්ට.
කච්චේරියේ තව හොඳයි . ගමේ ආරච්චිලා බලන්න එපැයි. අපේ ගමේ ආරච්චියා පිං පඩි ගන්නදාට අපි වගේ හිඟන්නන් පස්සෙන් එනවා. රුපියලක් දෙකක් කොටා ගන්න. පසුගිය ගංවතුර කාලයේ ආරච්චිලගේ රපෝර්තුව නැතිව ආණ්ඩුවෙන් සල්ලි ගෙව්වෙ නෑ.

I. රචකයා මින් ප්‍රකාශ කිරීමට උත්සාහ දරන්නේ කුමක්ද?
II. මෙම ගද්‍ය කොටසේ තේරුම ඔබේ වචනයෙන් ලියන්න.
III. මේ සංවාදය සඳහා යොදාගත් භාෂාව පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.
IV. අසරණ වැසියෝ තම දුක් ගැනවිලි ඉදිරිපත් කරන්නේ කච්චේරියටය නිදසුන් මගින් මෙම අදහස සනාථ කරන්න.

## (111) කොටස

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

4. උම්මග්ග ජාතකයේ එන ස්ත්‍රී ප්‍රශ්නය ඇසුරෙන් අමරා දේවියගේ ඉවසීම කෝප නොවීම හා බුද්ධිමත්භාවය පිළිබඳව නිදසුන් ගෙන විස්තර කරන්න.
5. විශාලා මහ නුවර යනු සෞභාග්‍යයෙන් පිරුණු නගරයකි උදාහරණ 3 ක් වත් ගෙන මෙම අදහස සනාථ කරන්න.
6. පෙත්සම නව කතාවේ ඔබ සිත් ගත් චරිතයක් තෝරා ගෙන එම චරිතය කතාව ගොඩ නැගීමට කොතරම් දුරට ඉවහල් වුයේදැයි විමසන්න.
7. සොබා දහමේ චමත්කාරය අපූර්ව ලෙස විස්තර කිරීමට "කුරුළු කූඩුවක්" කවි පංතිය සමත් වේ. නිදසුන් මගින් ඉහත අදහස විස්තර කරන්න.



www.eduLanka.LK

www.eduLanka.LK